ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

**01.** මාර්ග සංවර්ධන අධිකාරියේ හම්බන්තොට විධායක ඉංජිනේරු කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය හම්බන්තොට විධායක ඉංජිනේරු කොට්ඨාශය මගින් ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් වාහන හා යන්ත්‍ර සපයා ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | ලංසු කැඳවීම් අංකය | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|---|
| 1 | හම්බන්තොට විධායක ඉංජිනේරු කොට්ඨාශය මගින් සිදුකරනු ලබන මාර්ග නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කම්කරුවන් හා යන්ත්‍ර ප්‍රවාහනය සඳහා තට්ටුවේ ධාරිතාවය ඝණ අඩි 35 (දිග අඩි 7' පලල අඩි 5' උස අඩි 1') හෝ ඊට වැඩි තට්ටු ආවරණයක් සහිත කුඩා ලොරි රථ කුලී පදනම මත ලබා ගැනීම. | 01 හෝ ඊට වැඩි | RDA/EE/H/QUO/2024/01 | රු.5000.00 |
| 2 | හම්බන්තොට විධායක ඉංජිනේරු කොට්ඨාශය මගින් සිදුකරනු ලබන මාර්ග නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කම්පන තලන යන්ත්‍ර ඉන්ධන හා ක්‍රියාකරු රහිතව කුලී පදනම මත ලබා ගැනීම. | 01 හෝ ඊට වැඩි | RDA/EE/H/QUO/2024/02 | රු.5000.00 |

**02.** ලංසු කැඳවීම ජාතික ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

**03.** ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91ක් (2024.04.22) දක්වා ලංසුව වලංගු විය යුතුය.

**04.** එක් එක් ලංසු ඉහත වගුවේ දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය.(2024.04.22දින දක්වා වලංගු විය යුතුය) වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ

**05.**මිල ගණන් පත් ගෙවීමකින් තොරව හම්බන්තොට විධායක ඉංජිනේරු විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය,මාගම් රුහුණු පරිපාලන සංකීර්ණය, හම්බන්තොට වෙතින් හෝ https/:shorturl.at/lxC09 යොමුව මගින් පරීක්ෂාකර බැලිය හැක.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.01.09දින සිට 2024.01.22වන දින දක්වා පෙ.ව 9.00 පැය සිට ප.ව 15.00 පැය කාලය තුළ ආපසු නොගෙවනු ලබන රුපියල් 2,300.00 (වැට් බදු සහිත) ගාස්තුවක් ගෙවා විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය,මාගම් රුහුණු පරිපාලන සංකීර්ණය, හම්බන්තොට වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු අයදුම්පතක් ලබාගත හැකිය.(මෙම මුදල ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා අදාල නොවේ.)

**07.** ලංසුපත් සම්බන්ධ වැඩි විස්තර ලංසුපත් සමග ඉදිරිපත් කරනු ලැබේ.

**08.** සම්පූර්ණ කළ මුද්‍රා තබන ලද මිල ගණන් පත් 2024.01.24වන දින ප.ව 2.00 ට හෝ ඊට පෙර විධායක ඉංජිනේරු කාර්යාලය ,මාර්ග සංවර්ධන අධිකාරිය,මාගම් රුහුණු පරිපාලන සංකීර්ණය, හම්බන්තොට යන ලිපිනයට එවීම හෝ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකල යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ

**09.** ඔබගේ ලංසුපත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ලංසු කැඳවීමේ අංකය" සඳහන් කළ යුතුය

**10.** වැඩි විස්තර සඳහා හම්බන්තොට විධායක ඉංජිනේරු කාර්යාලයේ දුරකථන අංකය 047-2256666 අංකයෙන් අමතා දැනගත හැක

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
විධායක ඉංජිනේරු කාර්යාලය
මාර්ග සංවර්ධන අධිකාරිය
මාගම් රුහුණු පරිපාලන සංකීර්ණය
හම්බන්තොට